සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

නම : ............................................... කතෝලික ධර්මය කාලය : පැය 02 යි.

### I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

(1) ශු.බයිබලයේ මුළු පොත් ගණන,
(i) 73 කි. (ii) 74 කි. (iii) 71 කි. (iv) 72 කි.

(2) ආරම්භක දේව ප්‍රසාද නිධානයන් පූර්ණත්වයට පත් වන්නේ,
(i) පූජකවරය තුළිනි. (ii) අභිවෘද්ධි ආලේපය තුළිනි.
(iii) රෝගීන්ගේ ආලේපය තුළිනි. (iv) දිව්‍ය සත්ප්‍රසාදය තුළිනි.

(3) දෙවියන්වහන්සේ හතර වන දින මවන ලද්දේ,
(i) අහස හා ජලයයි. (ii) ඉර හඳ හා තාරකා ය.
(iii) ගොඩබිම හා ගස්කොළන් ය. (iv) දවාල හා රාත්‍රී ය.

(4) ජේසුතුමන්ගේ උත්පත්ති කාලයේ දී රජකම් කළේ ................................................... ය.
(i) පාරාවෝ රජු (ii) අගුස්තුස් අධිරජු
(iii) හෙරෝද් රජු (iv). දාවිත් රජු

(5) නිමල් තම දෙමව්පියන් රැකබලාගැනීමට නොහැකිව මහළු මඩමකට හැරලුවේය, ඔහු විසින් කඩකළ පනත වන්නේ,
(i) 4 වන පනත ය. (ii) 5 වන පනත ය.
(iii) 6 වන පනත ය. (iv) 2 වන පනත ය.

(6) මහ බ්‍රහස්පතින්දා දින ජේසුස් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද දේව ප්‍රසාද නිධානයක් වන්නේ,
(i) පාපොච්චාරණයයි. (ii) රෝගීන්ගේ ආලේපයයි.
(iii) පූජකවරයයි. (iv) අභිවෘද්ධි ආලේපයයි.

(7) ......................................... දින දෙව් මවුන්ගේ නිර්මල පිළිසිඳ ගැනීමේ මංගල්‍යය සමරයි.
(i) ජනවාරි 01 (ii) දෙසැම්බර් 8
(iii) අගෝස්තු 15 (iv) මැයි 31

(8) වර්තමාන ශු.සභාවේ දෘෂ්‍යමාන නායකයාණන් වනුයේ,
(i) වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ ය. (ii) 16 වන බෙනඩික් හිමිපාණෝ ය.
(iii) 2 වන ජුවාම් පාවුලු පාප්තුමා ය. (iv) 1 වන ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය.

(9) ජේසුස්වහන්සේගේ උපත පිළිබඳ මරියතුමියට දැන්වීමට දෙවියන් වහන්සේ විසින් තෝරා ගනු ලැබූ දේව දූතයා වන්නේ ,
(i) ගාබ්‍රියෙල් දේව දූතයා ය. (ii) මිඛායෙල් දේව දූතයා ය.
(iii) ස්නාවක ජොහාන්තුමා ය . (iv) රෆායෙල් දේව දූතයා ය.

(10) ජොහාන් සුබාරංචියේ සංකේතය වන්නේ ,
(i) ගවයා ය. (ii) රාජාලියා ය. (iii) මිනිසා ය. (iv) සිංහයා ය.

V **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා අංක යොදන්න.**

| A | | | B |
|---|---|---|---|
| (11) | මරියතුමියගේ ඥාතිවරියකි. | ( ) | 1. නම් තැබීම |
| (12) | දෙවියන් වහන්සේගේ උතුම්ම මැවිල්ල | ( ) | 2. ලූක් සුබාරංචිය |
| (13) | ජුදා ජාතීන්ගේ ආගමික චාරිත්‍රයකි. | ( ) | 3. වෙරෝනිකා |
| (14) | ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ සඳහන් කරයි. | ( ) | 4. ප්‍රසාද ස්නාපනයෙන් |
| | | | 5. එළිසබෙත්තුමිය |
| (15) | දේව දරුකම අපට ලැබෙන්නේ | ( ) | 6. මතෙව් සුබාරංචිය |
| | | | 7. මිනිසා |

V **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් ( 3 ) ලකුණ ද වැරදි නම් ( 8 ) ලකුණ ද යොදන්න.**

(16) දේව ප්‍රසාද නිධාන 07 කි . ( )

(17) සමගිවීමේ ප්‍රසාද නිධාන නිරතුරු ලබා ගත යුතුය. ( )

(18) පූජකවරය එක්වරක් පමණක් ලබාගත හැකි දේව ප්‍රසාද නිධානයකි. ( )

(19) දෙවියන් වහන්සේ වෙත අපගේ යුතුකම් දැක්වෙන පනත් හතකි. ( )

(20) ජීවිතයේ දුක් කරදර සහිත අවස්ථාවන්හි දී අංජනම් බැලීම වරදකි. ( )

( ලකුණු 2 x 20 = 40 )

## II කොටස

**V පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (i) ශ්‍රී ලංකාවේ ශුද්ධවන්තවරයා කවුද?
(ii) පහත සඳහන් ගීතිකාව සම්පූර්ණ කරන්න.
වන්දනීය වූ පූජනීය වූ
.................................................................
ධීර වීර වූ ඔබේ දහම් සේවයේ අනුහසින්
.................................................................

(iii) ජුසේවාස් පියතුමාගේ ජීවිතයෙන් ගතහැකි ආදර්ශ දෙකක් ලියන්න.
(iv) ජේසුස් වහන්සේ වයස අවරුදු 12 දී සිය දෙමව්පියන් සමග ජෙරුසලමට ගියේ ඇයි?
(v) ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා වන සංකේත දෙකක් ලියන්න.
(vi) දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් දෙකක් ලියන්න.
(vii) දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කරන ලද්දේ කවදා ද?
(viii) සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන දෙක මොනවා ද?
(ix) පූජා ප්‍රසාදිතුමන්ලාගේ සේවාවන් දෙකක් ලියන්න.
(x) කිතුනුවකු ලෙස ඔබ ජීවිතයෙ දී මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න. ( ලකුණු 2 x 10 - 20 )

(02) (i) 6 වන දේව පනතට විරුද්ධව ඔබ නොකළ යුතු දේවල් දෙකක් ලියන්න.
(ii) දස පනතේ පළමු පනත් තුන ලියා දක්වන්න.
(iii) දස පනතට අනුව ජීවත්වීමේදි ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. ( ලකුණු 2+3+5 = 10 )

(03) (i) සියලු මැවිලි වලට වඩා මිනිස් මැවිල්ල උතුම් වීමට හේතු දෙකක් ලියන්න.
(ii) මිනිසා දේව මැවිල්ල විනාශ කරන ආකාර තුනක් ලියන්න.
(iii) මැවිල්ල ආරක්ෂා කර ගැනීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. ( ලකුණු 2+3+5 = 10 )

(04) (i) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
(ii) දෙමව්පියන් වෙනුවෙන් දරුවන් සතු යුතුකම් තුනක් ලියන්න.
(iii) ගිහියෙකු ලෙස ඔබට පූජා ප්‍රසාදිතුමන්ලා වෙනුවෙන් කළ හැකි දේවල් පහක් ලියන්න.
( ලකුණු 2+3+5 = 10 )

(05) (i) පාස්කු අභිරහස යනු කුමක් ද?
(ii) සබත් දවසේදි ඔබ විසින් නොකළ යුතු කාර්යයන් තුනක් ලියන්න.
(iii) සබත් දිනයේ දී ඔබ විසින් කළ යුතු කාර්යයන් පහක් ලියන්න. ( ලකුණු 2+3+5 = 10 )

(06) (i) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
(ii) උත්පත්ති පොතේ සඳහන් කරුණු තුනක් ලියන්න.
(iii) පංච පුස්තකයට අයත් පොත් නම් කරන්න. ( ලකුණු 2+3+5 = 10 )

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

### කතෝලික ධර්මය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (i) | 6. | (iii) | 11. | (5) එලිසබෙත් තුමිය | 16. | 4 |
| 2. | (iv) | 7. | (ii) | 12. | (7) මිනිසා | 17. | 4 |
| 3. | (ii) | 8. | (iv) | 13. | (1) නම් තැබීම | 18. | 4 |
| 4. | (iii) | 9. | (i) | 14. | (2) ලූක් සුභාරංචිය | 19. | 5 |
| 5. | (i) | 10. | (ii) | 15. | (4) ප්‍රසාද ස්නාපනයෙනි | 20. | 4 |

( ලකුණු 2 x 20 - 40 )

### II කොටස

(01).
(i) ශු.ජුසේවාස් පියතුමා
(ii) ජුසේවාස් ධම්මදූත පුද්ගලයාණෝනි මෙලක් බිම අපේ එළිය වේ.
(iii) සරල බව
පරිත්‍යාගය
අන් අය වෙනුවෙන් කැපවීම
දේව අණට කීකරු වීම
(iv) පාස්කු මංගල්‍යය සැමරීමට
(v) ජලය
සුදු වස්ත්‍රය
පාස්කු ඉටි පහන
ශු.තෛලය
(vi) දරු සම්පත් ලැබීමට
පොළොව පුරා පැතිර යාමට
පොළොව වගා කිරීමට
පොළොවෙන් ලැබෙන අස්වැන්න ප්‍රයෝජනයට ගැනීමට
(vii) මහ බ්‍රහස්පතින්දා දින
(viii) සමගි සන්ධානය
රෝගීන්ගේ ආලේපය
(ix) සුවිශේෂය දේශනා කිරීම
සැබෑ එඩේරෙකු වීම
දිව්‍ය පූජාව පැවැත්වීම.
දේව ප්‍රසාද නිධාන දානය කිරිම.
(x) ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2 x 10 - 20 )

(02).
(i)
- අසභ්‍ය වචන කථා කිරීම
- අසභ්‍ය දෑ බැලීම.
- අපිරිසිදු සිත් ඇතිව ජීවත් වීම
- අයහපත් චරිතයක් ඇති කර ගැනීම.

(ii)
- සැබෑ වූ එකම දෙවියන්ට පමණක් වන්දනා කරව.
- දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය ගැන බොරුවටවත් නිරන්තරයට වත් නොදිවුරව.
- ඉරුදිනත් ණය මංගල්‍යය දිනත් නිවාඩු වලංගු කරව.

(iii)
- සැබෑ වූ එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම.
- සැම ඉරුදිනකම හා ණය මංගල්‍යය දිනකම දිව්‍ය පූජාවට සහභාගි වීම.
- මව්පියන්ට ගරු කිරීම.
- සොරකම් නොකිරීම.
- බොරු සාක්ෂි නොකීම.
- අන් අයගේ ජීවිත වලට ගරු කිරීම.

ආදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.

( ලකුණු 2+3+5 = 10 )

03).
(i)
- දේව ස්වරූපයට හා දේව සමාන කමට මවා තිබීම.
- මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට ජීවන හුස්ම හෙළීම.
- මිනිසා මැවූ දිනය ඉතා මනහර බව ප්‍රකාශ කිරීම.
- මිනිසා සතුන්ට නම් කිරීම.

(ii)
- පරිසර දූෂණය
- කැලි කසල ක්‍රමවත්ව බැහැර නොකිරීම.
- වනාන්තර විනාශය
- වායු දූෂණය.
- පොලිතින් භාවිතය
- ජල දූෂණය.

(iii) ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න.

( ලකුණු 2+3+5 = 10 )

04). (i) පූජකවරය
ආශිර්වාදකාර බන්ධනය

(ii)
- මහලු වියේදි දෙමාපියන්ට සැලකීම.
- දෙමව්පියන්ට ගරු කිරීම.
- දෙමව්පියන්ට කීකරු වීම.
- රෝගී වූ විට දෙමව්පියන්ට උපස්ථාන කිරීම.
- දෙමාපියන් සතුටු කිරීම.

(iii)
- එතුමන්ලා වෙනුවෙන් යාච්ඤා කිරීම.
- දිව්‍ය පූජාවට සහයෝගය දක්වීම.
- පියතුමන්ලාගේ නඩත්තුව සඳහා සහය වීම.
- ජන වන්දනා කටයුතු සඳහා සහය වීම.

- ඔවුන්ගේ අවශ්‍යතා සොයා බැලීම.

ආදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.

( ලකුණු 2+3+5 = 10 )

05). (i)
- ජේසුස් වහන්සේගේ දුක් විදීම, මරණය හා උත්ථානයයි.

(ii)
- දිව්‍ය පූජාව අතපසු කිරීම.
- ඉරුදින අනවශ්‍ය ලෙස මුදල් ඉපයීමේ කාර්යයන්හි නිරත වීම.
- අසංවර ඇඳුමෙන් දිව්‍ය පූජාවට පැමිණීම.
- දේවස්ථානය තුළ කතා කිරීම.
- ඉරුදින උපකාරක පංතිවලට හා විනෝද ගමන් යාම.
- දේවස්ථානය තුළ ජංගම දුරකථන භාවිතය.

ආදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

(iii)
- දිව්‍ය පූජාවට සහභාගි වීම.
- රෝගීන් බැලීමට යාම.
- අසරණයන්ට පිහිට වීම.
- තම හිත මිතුරන් දිව්‍ය පූජාවට සහභාගි කරවීම.
- දහම් පාසලට සහභාගි වීම.

ආදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

( ලකුණු 2+3+5 = 10 )

06). (i) ව්‍යවස්ථාවලිය
මෝසෙස්තුමාගේ නීතිය
නීතිය
මෝසේස්තුමාගේ ව්‍යවස්ථාව

(ii) දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවීම.
ආදම් හා ඒව පාපයට වැටීම.
කායින් හා ආබෙල් පිළිබඳ කතා පුවත.
නෝවා හා ජල ගැල්ම.

(iii) උත්පත්ති පොත
නික්මයාම
ලෙවී ව්‍යවස්ථාව
ගණන් කථාව
ද්විතීය නීති සංග්‍රහය

( ලකුණු 2+3+5 = 10 )